ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නීතිවේදී උපාධිය - 6 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2006/2007

090

දීලික්ත නීතිය - **LWU 3326/4326**

කාලය - පැය 3 යි.

---

දිනය - 2007.03.29 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.

01. "........... ගිවිසුමක් නොමැතිව යම් පුද්ගලයකු තුළ ඇති යම් විශේෂ හැකියාවක් යටතේ යම් ක්‍රියාවක් සිදු කරයි නම් හා වෙනත් පුද්ගලකු එම හැකියාව මත විශ්වාසය තබන විට එකී හැකියාව එම අනෙක් පුද්ගලයාගේ ආධාරය පිණිස යොදා ගත හැකි අවස්ථාවක අවධානයේ යුතුකමක් උද්ගත වන බව දැන් තීරණාත්මක සාධකයක් වශයෙන් සැලකිය යුතුය........"

මොරිස් සාමි *Woods v.Martins Bank Ltd,(1993)1QB 55 හිදී*

ඉහත ප්‍රකාශය නොසැලකිලිමත් අවනිදේශන සම්බන්ධයෙන් වර්තමාන තත්වය පිළිබිඹු කරයි ද? ඔබගේ පිළිතුර අදාල නඩු තීරණ ඇසුරෙන් අගයන්න.

02. සුප්‍රසිද්ධ මුද්‍රා නාට්‍ය ශිල්පිනියක් වූ ජයනි, වෙන්දේසියකින් මිලයට ගන්නා ලද වටිනා ප්‍රතිමාවක් රැගෙන මහේන් සමඟ ඔහුගේ මෝටර් සයිකලයෙන් තම නිවස බලා යන අතරතුරේදී නොසැලකිලිමත් ලෙස ධාවනය කළ නලින්ගේ රිය මෝටර් සයිකලය හා ගැටුණි. අනතුරෙහි ප්‍රතිඵලයක් වශයෙන් ජයනි හා මහේන් යන දෙදෙනාම පාර මතට ඇද වැටුනෝය. කිසිවක් කර කියාගත නොහැකිව ජයනි පාර මත වැටී සිටින විට ලොරියක් ජයනිගේ දකුණු පාදය යටකර ගෙන ගියේය. මීට හේතුව වූයේ ලොරි රියදුරාට නියමිත වේලාවට තම ලොරිය නවතා ගැනීමට නොහැකි වීමයි. අසලින් ගමන් කරමින් සිටි සිදත් ඔවුන් දෙදෙනාම රෝහලට රැගෙන යන ලදී.

හෘද රෝගියකු වූ මහේන්ට රෝහලේදී දෙන ලද එන්නතක් හේතුවෙන් ඔහුගේ තත්වය බරපතල විය. ඔහු දින තුනකින් මිය ගියේය. ජයනිට ඇයගේ දකුණු පාදය භාවිතා කළ නොහැකි වූ නිසා කලින් එකඟ වී තිබුණු සංදර්ශණ කිහිපයක රඟපෑමට නොහැකි විය. අනතුර සිදුවන අවස්ථාවේදී ළඟ සිටි පුද්ගලයකු විසින් වටිනා ප්‍රතිමාව සොරකම් කර ගෙන තිබුණි.

ජයනි සහ මහේන් සම්බන්ධයෙන් නලින්ගේ වගකීම සාකච්ඡා කරන්න. ඔබගේ පිළිතුර නඩු තීන්දු ඇසුරෙන් අගයන්න.

03. "සහායක නොසැලකිල්ල හෝ අවදානම කැමැත්තෙන්ම භාර ගැනීම යන මේ රක්ෂණ දෙකින් කවරක් වුවද, පැමිණිලිකරු සම්පූර්ණයෙන්ම පරාජයට පත් කරන තාක් කල් ,මේ රක්ෂණ දෙක අතර තත්වාකාර වෙනසක් දැක්වීම ශාස්ත්‍රීය වශයෙන් පමණක් වැදගත් විය. එහෙත් සහායක නොසැලකිල්ල සඳහා වන්දි පංගු කිරීමේ මූලධර්මයක් හඳුන්වා දීම, අවදානම කැමැත්තෙන්ම භාර ගැනීම යන රක්ෂණය සම්පූර්ණ රක්ෂණයක් වශයෙන් අනාගතයේ ඉටුකරන කාර්යය සම්බන්ධයෙන් බරපතල ප්‍රශ්ණයක් මතුකර ඇත. තමාද නොසැලකිලිමත් පැමිණිලිකරුවකුට එසේ නොසැලකිලිමත් නොවූවකුට වඩා හොඳ තත්වයක් තිබීමට පුළුවන් වීම තරමක් අමුතු ස්වභාවයකි. මේ ගැටළුව සම්බන්ධයෙන් අධිකරණය දක්වා ඇති ප්‍රතිචාරය වී ඇත්තේ අවදානම කැමැත්තෙන්ම භාර ගැනීම නමැති රක්ෂණය කලාතුරකින් පමණක් සාර්ථක වන තත්වයකට පත්වන අයුරෙන් පෙරටත් වඩා දැඩි අවශ්‍යතාවයක් ඒ රක්ෂණය සඳහා පැනවීමයි."

**John G.Fleming, The Law of Torts, pg 264**

ඔබගේ පිළිතුරෙහි නඩු තීන්දු ඇතුලත් කරමින් අවදානම කැමැත්තෙන්ම භාර ගැනීම යන රක්ෂණයේ වර්ධනය ඉහත ප්‍රකාශය ඇසුරින් සාකච්ඡා කරන්න.

04. අමල්, කමල් සහ රමල් 'වෘත්තීමය කිමිදුම් සමාජය' මගින් පුහුණුව ලත් කිමිදුම්කරුවෝ වූහ. ඔවුන් කිමිදුම් සමාජයට ඇතුලත් වන අවස්ථාවේ අයදුම් පත්‍රයෙහි පහත සඳහන් කොන්දේසි ඇතුලත් විය.

1. අවවාදයයි. - කිමිදීම අනතුරුදායක වේ. අයදුම්කරුවන් කිමිදුම් සමාජයට ඇතුලත් වන්නේ තමන්ගේ අවදානමට යටත්ව ය.

2. කිමිදුම් සමාජයට ඇතුලත් වන විට තිබුණ එක් කොන්දේසියක් වූයේ පුහුණු සැසිවාරවලදී සිදුවන පෞද්ගලික අනතුරු හෝ මරණය සම්බන්ධයෙන් පුහුණුකරු හෝ සමාජය වගකීමට යටත් නොවන බවයි.

3. සමාජය මගින් සියළුම උපකරණ සපයනු ලැබේ.

මුහුද රළු වූ එක්තරා දිනක මොහාන් නම් පුහුණුකරු සමඟ පුහුණු සැසිවාරයක යෙදී සිටි අවස්ථාවක පහත සඳහන් සිදුවීම් උද්ගත විය.

(අ) අමල්ගේ ඔක්සිජන් ටැංකිය නිසි පරිදි සවිකර නොතිබූ නිසා හුස්ම ගැනීමේ අපහසුතාවයෙන් ඔහු මරණයට පත් විය.

(ආ) මුහුදෙහි ඇති වූ දිය වැලක් නිසා කමල් වෙනත් දිශාවකට ගසාගෙන ගියේය. ඔහු විශාල ගලක වැදීම නිසා ඔහුගේ උකුල් ඇටය බිඳුනි.

(ඇ) මත් ද්‍රව්‍ය පානය කර තිබූ රමල් හිස් ආවරණයක් නොමැතිව කිමිදුනේය. ඔහු ගලක් මතට කිමිදීම නිසා ඔහුගේ හිසට තුවාල සිදු විය.

මෙම සිදුවීම් සම්බන්ධයෙන් කිමිදුම් සමාජයේ වගකීම සාකච්ඡා කරන්න.

"ප්‍රතිපුරුෂ වගකීම නමැති මූලධර්මය ඉතා පැහැදිලි, තර්කාන්විත හෝ නීතිමය සිද්ධාන්ත යටතේ නොව සමාජ පහසුභාවය සහ රළු යුක්තිය මත වර්ධනය වී ඇත. වඩා යහපත් කාර්යයක් ඉටු කිරීමේ අරමුණින් සේවකයෙක් සේවයෙහි යොදවන ස්වාමියා තම සේවකයාගේ විෂය පථය තුල ඉතා කලාතුරකින් සිදුවන සෑම තෝරතයක් සඳහාම මුළු ලෝකයටම කරුණු කියා පෑමට බැඳී ඇත.''

ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ වන්නේ ද? මෙම අභිප්‍රාය සාර්ථක කර ගැනීමෙහි ලා ප්‍රතිපුරුෂ වගකීම පිළිබඳ නීතිය වර්ධනය වී ඇති ආකාරය පිළිබඳව නඩු තීන්දු ඇසුරෙන් සාකච්ඡා කරන්න.

පෞද්ගලික බස් රථ පනත මගින් පෞද්ගලික බස් සේවා හිමියන්ට තම මධ්‍යම බස් නැවතුම්පළ සහ වැඩපල කොළඹ නගරයෙන් කි.මී.20 ඇතුලත පිහිටුවීමට අවසන දෙන ලදී. ඩේවිඩ් සිල්වා බස් සමාගම ස්වකීය මධ්‍යම බස් නැවතුම් වල හා වැඩපල රත්මලානේ සේනකගේ නිවයට යාබදව පිහිටුවන ලදී. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ඔහුගේ නිවස අවට රැස්වූ විශාල ජනකාය නිසා සහ ශබ්දය නිසා සේවකට විවිධ අපහසුකම් ඇති විය.

සේනක තම ඉඩමේ පවත්වාගෙන යන ලොන්ඩරි සේවාවට මෙම බස් නැවතුම්පල සහ වැඩපල නිසා ඉතා බලවත් ලෙස හානිකර ප්‍රතිඵල ඇති විය. බස් රථ වලින් අධික ලෙස පිට වූ දුම නිසා තමා විසින් වේලීමට එල්ලන ලද රෙදි පිලිවල නිතරම කළු පැල්ලම් ඇති වන බව ඔහු පසුව සොයා ගන්නා ලදී. එක් සැන්දෑවක සේනකගේ පුතා ලේ වමනය කිරීම නිසා වහාම රෝහල් ගතකරන ලදී. කාබන් මොනොක්සයිඩ් දුමාරය ආශ්වාස කිරීම වමනය යාමට හේතුව වශයෙන් සොයා ගන්නා ලදී.

බස් නැවතුම් වල සහ වැඩපල කිට්ටුව පිහිටා තිබීම යන්න සම්බන්ධයෙන් ඩේවිඩ් සිල්වා බස් සමාගමට එරෙහිව වන්දි ඉල්ලා සිටීමට සේනක අදහස් කරයි. සාකච්ඡා කරන්න.

රාවණා ප්‍රකාශකයන් විසින් ප්‍රකාශයට පත් කරන ලද සඟරාවක, නිසල් විසින් ලියන ලද ලිපියක් ඇතුලත් විය. මාතර දිස්ත්‍රික්කයේ අධිවේගී මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සඳහා R සහ R ඉදිකිරීමේ සමාගම වෙත ප්‍රදානය කරන ලද ගිවිසුම සම්බන්ධයෙන් පහත සඳහන් දේ ලිපියෙහි ඇතුලත් වී තිබුණි.

"...................... ගිවිසුම ප්‍රදානය කිරීමට පෙර මෙම සමාගමේ අධ්‍යක්ෂක වරුන්ට සහ මහාමාර්ග අධිකාරියේ වගකිව යුතු නිලධාරීන්ට මුහුදුබඩ නිවාඩු නිකේතනයකදී සංග්‍රහ කළ බව සියල්ලන් හොඳින් දන්නා කරුණකි..........

මෙම සමාගමේ ඊනියා විශේෂඥයන්ගේ නිපුණතා දැක ගැනීමට සහ අධිවේගී මාර්ග ප්‍රතිසංස්කරණය සඳහා වැය කර ඇති අනවශ්‍ය මුදල් සම්භාරය නිශ්චය කිරීමට නම් මෙම ප්‍රදේශයේ සැතපුමක් හෝ දෙකක් රළු ධාවනයේ යෙදීම ප්‍රමාණවත් ය.''

මෙම සඟරාව පැතුම්ගේ පොත් හලෙහි අළෙවි විය.

නිසාල්ට සහ පැතුම්ට එරෙහිව අපහාසය සම්බන්ධයෙන් නඩුගෙන ඒමට R සහ R ඉදිකිරීමේ සමාගම බලාපොරොත්තු වේ.

(අ) R x R ඉදිකිරීමේ සමාගමට උපදෙස් දෙන්න.

(ආ) නිසල් සහ පැතුම්ට ලබාගත හැකි විත්තිවාචක කිසිවක් ඇත්දැයි සාකච්ඡා කරන්න.

පහත දැක්වෙන ඒවායින් 2 ක් පිළිබඳව සටහන් ලියන්න.

(අ) තෝරත නීතිය හා රක්ෂණය අතර ඇති වෙනස්කම්.

(ආ) සාවද්‍ය ලෙස සිරකර තැබීම පිළිබඳව නඩුකරය.

(ඇ) කන්‍යා දූෂණය පිළිබඳ නඩුකරය.

(ඈ) *ප්‍රියානි සොයිසා එ රියෙන්සි අර්සකුලරත්න*
**(CA 173/93(F))(unreported)**

\- හිමිකම් ඇවිරිණි. -